ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**

දිනය **2013 පෙබරවාරි මස 11 වැනි දින**


## 2012 දෙසැම්බර් මාසයේ විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

2012 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය ද, ආනයන වියදම පාලනය කිරීම සඳහා වසර ආරම්භයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාරයක් වශයෙන් පාරිභෝගික භාණ්ඩ සහ අන්තර්භාණ්ඩ ආනයන වියදම 2012 අප්‍රේල් මාසයේ සිට ක්‍රමයෙන් පහත වැටුණි. එබැවින්, 2012 වසරේ පැවැති අයහපත් ගෝලීය ඉල්ලුම සමග අපනයන ආදායම පහත වැටුණද, වෙළෙඳ ගිණුමෙහි ගෙවුම් ශේෂයෙහි හිඟය 2012 වසරේ දී අඩු විය.


සමස්ත අපනයන ආදායමෙන් හතරෙන් තුනකට පමණ දායකත්වය ලබා දෙන කාර්මික අපනයන ආදායම පහත වැටීම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී, 2012 දෙසැම්බර් මාසයේ අපනයන ආදායම පහත වැටුණි. කෙසේවෙතත්, තේ, කුළුබඩු, සකස් නොකළ දුම්කොළ සහ මුහුදු ආහාර අපනයන ආදායම ඉහළ යාම නිසා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2012 දෙසැම්බර් මාසයේ දී කෘෂිකාර්මික අපනයන ආදායම වර්ධනය විය. 2012 මැයි මාසයේ පමණ සිට ශ්‍රී ලංකාවේ තේ අපනයන සඳහා ඉහළ මිලක් ලබාගත හැකි වූ අතර, එය වසරේ අපනයන ආදායම යහපත් මට්ටමක පවත්වා ගැනීම සඳහා උපකාරී විය. 2012 වසරේදී අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනයන්හි ක්‍රියාකාරිත්වය සැලකීමේ දී කුළුබඩු, සකස් නොකළ දුම්කොළ සහ මුහුදු ආහාර අපනයන වර්ධනය විය. එහෙත්, කෘෂිකාර්මික අපනයන යටතේ වර්ගීකරණය කර ඇති බොහොමයක් කාණ්ඩයන්ගෙන් ලද අපනයන ආදායම 2012 වසරේ දී පහත වැටීම නිසා, කෘෂිකාර්මික අපනයන ආදායම 2012 වසරේදී පහත වැටීමක් වාර්තා

කරන ලදී. මුළු අපනයන ආදායමෙන් තුනෙන් එකකට වඩා ප්‍රමාණයකට දායකත්වය ලබා දෙන ඇඟළුම් අපනයන ඇතුළුව, කාර්මික අපනයන යටතේ වර්ගීකරණය කර ඇති බොහොමයක් කාණ්ඩයන්ගෙන් ලද අපනයන ආදායම පහත වැටීමත් සමග, 2012 වසරේ කාර්මික අපනයන ආදායම ද පහත වැටුණි. 2011 වසරේ මුල් මාස කිහිපය තුළ දී ඉහළ අගයක් ගත් කපු, රබර් සහ ඇළුමිනියම්, තඹ ඇතුළු ඇතැම් ලෝහ වර්ග වැනි ප්‍රධාන කාර්මික නිෂ්පාදිත යෙදවුම්හි මිල ක්‍රමයෙන් පහත වැටුණු අතර, 2012 වසරේ කාර්මික අපනයන ආදායම පහත වැටීම සඳහා මෙය සැලකිය යුතු අන්දමින් දායක විය.

2012 දෙසැම්බර් මාසයේ දී ආනයන වියදම සැලකිය යුතු අයුරින් පහත වැටුණි. ආහාර ආනයනය මෙන්ම රථවාහන ඇතුළු අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටීමත් සමග 2012 දෙසැම්බර් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. රථවාහන ආනයන වියදම අඛණ්ඩව පහත වැටීම, 2012 වසරේ සමස්ත ආනයන වියදම පහත වැටීම සඳහා සැලකිය යුතු අන්දමින් දායක විය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමග සැසඳීමේ දී, 2012 දෙසැම්බර් මාසයේ දී අන්තර්භාණ්ඩ ආනයන වියදම ද පහත වැටුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත, දියමන්ති, වටිනා හා අර්ධ වටිනා ගල් වර්ග සහ ඛනිජ නිෂ්පාදිත ආදිය සඳහා පැවැති අඩු ආනයන වියදම, මෙම පහත වැටීම සඳහා හේතුවිය. 2012 අප්‍රේල් මාසයේ සිට ආනයන වියදම දිගින් දිගටම පහත වැටීම සඳහා පාරිභෝගික භාණ්ඩ සහ අන්තර්භාණ්ඩ යන ආනයන කාණ්ඩයන් දෙකම දායක වී ඇත. කෙසේවෙතත්, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම ඉහළයාමත් සමග 2012 දෙසැම්බර් මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම වර්ධනය විය.



රූප සටහන 1. අපනයන, ආනයන සහ ගෙවුම් තුලනයේ වෙළෙඳ ශේෂය



රූප සටහන 2. රටවල් අනුව සංචාරක පැමිණීම් (2012)

ගෙවුම් තුලනයේ සේවා ගිණුම සහ ජංගම සංක්‍රාම තුළින් වූ ලැබීම් සලකා බැලීමේ දී සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගෙන් ප්‍රේෂණ සඳහා වසරක දී ලද ඉහළම ලැබීම් ප්‍රමාණයන් 2012 වසරේ දී වාර්තා විය. 2012 වසරෙහි දෙසැම්බර් මාසයේ දී සංචාරක පැමිණීම් සංඛ්‍යාව 122,252 ක් දක්වා සියයට 25.4 කින් ඉහළ ගියේය. ඒ අනුව 2012 වසරේ දී මුළු සංචාරක පැමිණීම් සංඛ්‍යාව 1,005,605 ක් දක්වා සියයට 17.5 කින් වර්ධනය විය. 2012 වසරේ දී ප්‍රථමවරට සංචාරක පැමිණීම් සංඛ්‍යාව මිලියන 1 ඉක්මවීය.

මේ අතර 2012 දෙසැම්බර් මාසයේ දී සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 133.5 ක් ලෙස වාර්තා වූ අතර එය මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වේ. 2012 වසර තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 1,039 ක් දක්වා සියයට 25.1 කින් වර්ධනය වීමක් ලෙස වාර්තා විය. සංචාරක ඉපැයීම් පළමුවරට 2012 වසරේ දී එ.ජ.ඩොලර් බිලියනය ඉක්මවීය. සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2012 දෙසැම්බර් මාසයේ දී පසුගිය වසරේ දෙසැම්බර් මාසය හා සැසඳීමේ දී සියයට 9.3 කින් වර්ධනය විය. 2012 වසර තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 5,985.3 ක් දක්වා සියයට 16.3 කින් වර්ධනය විය.

2012 වසර තුළදී, ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම වෙත විදේශ ව්‍යවහාර මුදල් සැලකිය යුතු ප්‍රමාණයක් ලැබිණි. 2012 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ලැබුණු ශුද්ධ විදේශ ආයෝජන ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 305 ක් දක්වා ඉහළ ගිය අතර එය 2011 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 171 ක ශුද්ධ ගෙවීමක් ලෙස වාර්තා විය. 2012 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත්හි විදේශීය ආයෝජන කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමින්, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වූ ශුද්ධ ලැබීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 843 ක් දක්වා ඉහළ ගිය අතර එය 2011 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 233 ක් විය. තවද, 2012 වසරේ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 2,869 ක් වූ අතර, 2012 වසර තුළ දී වාණිජ බැංකුවල දිගුකාලීන ණය ගැනීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 973 ක් විය. ආයෝජන මණ්ඩලය සමග ලියාපදිංචි වූ සමාගම් වෙත ලැබුනු විදේශ ණය ඇතුළත් මුළු විදේශ ඍජු ආයෝජන ලැබීම් ප්‍රමාණය 2012 වසරේ පළමු මාස නවය තුළ දී එ.ජ.ඩොලර් මිලියන 615 ක් ලෙස වාර්තා වූ අතර, වසරෙහි ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී විදේශ ආයෝජන වැඩි ප්‍රමාණයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2012 වසර අවසාන වන විට, දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 6,877 ක් වූ අතර, දළ නිල සංචිත සහ වාණිජ බැංකුවල විදේශීය වත්කම් ඇතුළත් මුළු විදේශීය සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 8,358 ක් විය. විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස වශයෙන් සැලකූ විට, 2012 වසර අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.3 කට සමාන වන අතර, මුළු විදේශීය සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.3 කට සමාන විය.

## සංඛ්‍යා සටහන 1. විදේශ අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශයක් - දෙසැම්බර් 2012 [අ]

| කාණ්ඩය | 2011 දෙසැ. එ.ජ.ඩො. මිලියන | 2012 දෙසැ. එ.ජ.ඩො. මිලියන | දෙසැ. වර්ධනය (සියයට) | 2011 ජන. සිට දෙසැ. එ.ජ.ඩො. මිලියන | 2012 ජන. සිට දෙසැ. එ.ජ.ඩො. මිලියන | ජන. සිට දෙසැ. වර්ධනය (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | **933.4** | **871.0** | **-6.7** | **10,558.8** | **9,773.5** | **-7.4** |
| *මෙයින්,* | | | | | | |
| කෘෂිකාර්මික | 211.2 | 217.4 | 2.9 | 2,527.8 | 2,331.5 | -7.8 |
| *මෙයින්,* තේ | 133.1 | 138.3 | 4.0 | 1,490.9 | 1,411.9 | -5.3 |
| කාර්මික | 719.9 | 643.7 | -10.6 | 7,991.7 | 7,371.2 | -7.8 |
| *මෙයින්,* | | | | | | |
| රෙදිපිළි හා ඇඟළුම් | 382.2 | 357.8 | -6.4 | 4,191.2 | 3,991.1 | -4.8 |
| රබර් නිෂ්පාදිත | 80.5 | 76.7 | -4.7 | 884.8 | 859.4 | -2.9 |
| ආහාර, පාන හා දුම්කොළ | 31.7 | 21.1 | -33.3 | 348.2 | 284.3 | -18.3 |
| ඛනිජ ද්‍රව්‍ය | 1.9 | 9.2 | 383.3 | 32.9 | 61.3 | 86.4 |
| ආනයන | **1,875.8** | **1,512.2** | **-19.4** | **20,268.8** | **19,086.5** | **-5.8** |
| *මෙයින්,* | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 325.3 | 240.2 | -26.2 | 3,653.6 | 2,995.2 | -18.0 |
| *මෙයින්,* ආහාර හා පාන වර්ග | 132.4 | 112.1 | -15.3 | 1,566.9 | 1,304.4 | -16.8 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 192.9 | 128.0 | -33.6 | 2,086.7 | 1,690.8 | -19.0 |
| අන්තර් භාණ්ඩ | 1,160.4 | 869.9 | -25.0 | 12,275.3 | 11,571.5 | -5.7 |
| *මෙයින්,* ඛනිජ තෙල් | 488.8 | 366.1 | -25.1 | 4,794.9 | 5,038.5 | 5.1 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 201.9 | 193.8 | -4.0 | 2,320.7 | 2,266.4 | -2.3 |
| ආයෝජන භාණ්ඩ | 381.7 | 401.3 | 5.1 | 4,286.1 | 4,492.2 | 4.8 |
| *මෙයින්,* යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 197.5 | 221.1 | 11.9 | 2,141.4 | 2,258.4 | 5.5 |
| ප්‍රවාහන උපකරණ | 95.0 | 58.0 | -38.9 | 1,064.6 | 991.9 | -6.8 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 88.7 | 121.6 | 37.1 | 1,076.1 | 1,237.4 | 15.0 |
| වෙළෙඳ ශේෂය | **-942.4** | **-641.2** | **-32.0** | **-9,710.0** | **-9,313.0** | **-4.1** |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | **506.2** | **553.2** | **9.3** | **5,144.8** | **5,985.3** | **16.3** |
| විදේශීය සෘජු ආයෝජන (ආ) | | | | **679.3** | **614.7** | **-9.4** |
| විවිධ ආයෝජන (ශුද්ධ) | **-14.4** | **24.9** | | **-171.4** | **305.2** | |
| වාණිජ බැංකු විසින් ලබා ගත් දිගුකාලීන විදේශ ණය | | | | | **973.0** | |
| සංචාරක ඉපැයීම් | **94.6** | **133.5** | **41.1** | **830.3** | **1,038.7** | **25.1** |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඇ) | **364.1** | **247.3** | **-32.1** | **4,352.8** | **5,256.9** | **20.8** |
| මෙයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 162.1 | 76.2 | -53.0 | 1,153.5 | 2,236.4 | 93.9 |
| දිගු කාලීන ණය | 185.9 | 145.5 | -21.7 | 3,028.9 | 2,869.1 | 5.3 |

(අ) තාවකාලික

(ආ) ආයෝජන මණ්ඩලයේ අනුමත සමාගම් ලද විදේශීය ණය ද ඇතුළුව, විදේශීය සෘජු ආයෝජන ලැබීම්, වසරේ පළමු මාස නවය සඳහා වාර්තා කර ඇත.

(ඇ) රජය ලද ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර විකිණීමෙන් ලද ලැබීම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.